| | | |
|---|---|---|
| විද්‍යාලය | : | ර/ ඇඹෑපොල ශ්‍රී මහින්ද මහා විද්‍යාලය |
| සිංහල භාෂාව හා සාහිත්‍යය | : | 13 ශ්‍රේණිය පැවරුම් |
| විෂය භාර ගුරු | : | ඊ.ඒ.එස්.එච්. ඇතුල්දූර |

**ප්‍රශ්නය : පහත සඳහන් උද්ධෘතවල අවස්ථා සම්බන්ධ ලියන්න.**

(1)
- i. ''මම වන්නා දරු ශෝකයෙන් හඬමි.''
- ii. ''තෙල හදපීඨය මත්තේ හිඳිනාහු ඒ බ්‍රාහ්මණයාණෝ යැ.''
- iii. ''එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නො ඇලෙමි ''
- iv. ''ක්‍රීඩාවක් කළ දවසෙක සිට ඒ ගුණය ඇති වී ද ''
- v. ''හොඳට හිටියොත් බැරුවයැ ඕන එකක් ඉගෙන ගන්න ''
- vi. ''උඹට ඕනද මාව උඹේ ගෙදර තියා ගන්ට.''

(2)
- I. ''අපගේ දෙමව්පියන්ගෙන් මුසුප්පුවක් ඇති නියා දැ.''
- ii. ''එසේ වූ දුක් මට විඳගත නොහෙමි ''
- iii. ''එතර තබා අවුත් තොප කැඳවාගෙන යෙමි. ''
- iv. ''උන් දූන් නො එන්නේ තුන් අවුරුද්දකැ. ''
- v. ''දූන් වෙලාව කීයට විතර ඇත්ද? ''
- vi. ''හාං! උඹට කිසි වරදක් වෙන්නේ නෑ ''

(3)
- i. ''එම්බල බමුණ අසන දෙයටත් වඩා දුටු දෙය ප්‍රත්‍යක්ෂ ය.''
- ii. ''මේ මුළු පොළොව තොප තරම් වෛද්‍යාචාරී කෙනෙක් නැත ''
- iii. ''පර්වතයෙන් බැස මිනිසුන්ට විසිය තැන නොවෙසෙත් ව ''
- iv. ''ඕ තොම තමා හා සමාන ජාති ඇති පුරුෂයන් විසින් එවන ලද පඬුරු නොගන්නී ය.''
- v. ''ඒව තමුසෙ බලාගන්න ඕනැ... මට කියන්න එපා ''
- vi. ''එයත් එක්ක ආවෙ අප්පොච්චිටත් විරුද්ධ ව මගේ කැමැත්තෙන් ''

(4)
- i. ''යහපත සොඳුර, වඳුව.''
- ii. ''පුතණ්ඩ එසේ වූ බසක් මා කන නොවකව ''
- iii. ''අසවල් ගඟ සමීපයේ උන් ස්ත්‍රී වෙහෙසන්ට උව මැනවැ ''
- iv. ''කුමක් පිණිස මුරගාවූ ද ''
- v. ''මටත් කියන්නෙ කරවල විකුණන්න ද? ''
- vi. ''මං කොහොම ද එයාගෙ නම කියන්නෙ අයියා ''

(5)
- i. ''කවර දවසෙක අවුත් කෙදිනක දී මා හා කතා කෙළේ ද ''
- ii. ''එසේ නො වදාළ මැනව, මම නුඹ වහන්සේට ගැති නොවෙම් ද ''
- iii. ''ස්වාමීනි, මෙසේ වූ උපද්‍රව ඇති තෙනින් අපට ප්‍රයෝජන කිම් ද ''
- iv. ''මෝ තොම සස්වාමික ද අස්වාමික ද ''
- v. ''ගෙඹි පැටික්කියෙ ඇයි උඹ විල අතහැර දාල ආවේ? ''
- vi. ''මම ඇවිල්ල පැයක් හමාරක් වෙනව ''